# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2496/38 - 2026 ජූලි මස 10 වැනි සිකුරාදා - 2026.07.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 ජූලි මස 10 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි **"2026 අංක 07 දරන භාණ්ඩ ආනයනය තහනම් කිරීම පිළිබඳ ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.
2. බලහත්කාරයෙන් යොදවන ශ්‍රමය මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන්, කැණීම් කරනු ලබන, නිෂ්පාදනය කරනු ලබන හෝ නිම කරනු ලබන ඕනෑම භාණ්ඩයක් ආනයනය කිරීම මෙයින් තහනම් කරනු ලැබේ.
3. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තීරණ සැළකිල්ලට ගනිමින්, මෙම රෙගුලාසි අදාළ විය යුතු භාණ්ඩ, අස්ථිත්ව හෝ රටවල් අමාත්‍යවරයා විසින් කලින් කලට නිවේදනය කළ හැකිය.
4. නිවේදනය කරනු ලැබූ අස්ථිත්වයකින් හෝ රටකින් උත්පාදනය වන භාණ්ඩ ආනයනය කරන්නන් විසින්, ආනයනය කිරීමට අපේක්ෂිත භාණ්ඩ බලහත්කාරයෙන් යොදවන ශ්‍රමය මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන්, කැණීම්කර, නිෂ්පාදනයකර හෝ නිමවා නොමැති බව තහවුරු කිරීම සඳහා, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කලට නියම කරනු ලබන ලේඛනමය සාක්ෂි, ප්‍රකාශ හෝ සහතික ඉදිරිපත් කළ යුතුය.
5. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිවයුතු නියාමන අධිකාරිය වන අතර, රේගු ආඥාපනතට අනුකූලව මෙම රෙගුලාසි බලාත්මක කිරීම සඳහා අනුගමනය කළ යුතු පරිපාලන ක්‍රියාපටිපාටීන් නියම කරමින් දෙපාර්තමේන්තුමය නියෝග නිකුත් කළ හැකිය.

EOG 07 - 0149

1A - PG 7801 — 373 (2026/07)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*